# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1936/45 - 2015 ඔක්තෝබර් මස 15 වැනි බ්‍රහස්පතින්දා - 2015.10.15

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය*: GAL/LAN/ACQUIS/A13/53.

*ඉඩම් අමාත්‍යාංශයේ අංකය*: 4/3/6/2012/එච්ඩබ්/145.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම/පරවශ්‍යතාවය ලබා ගැනීමට රජය අදහස් කරන බැවි, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර:*

පිහිටීම - කෑගල්ල දිස්ත්‍රික්කයේ, ගලිගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ බෙලිගල් කෝරළේ (නැගෙනහිර) කොට්ඨාසයේ, හොළොම්බුව ගමෙහි පිහිටි, සර්වේයර් ජනරාල් විසින් මැන සකස් කරන ලද මූලික පිඹුරු අංක කෑ3460 හා 2015.08.24 දිනැති පිඹුර අනුව මුළු ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0532 ක් වූ ඉඩම් කොටස්:

සැලැස්මේ අංකය - කෑ3460

01. **කැබලි අංක 1**

ඉඩමේ නම: වරාමුල්ලඕවිට; හිමිකම් කියන අය: ආර්. ඒ. ටී. ඩබ්. එස්. රණවීර සහ තවත් අය; ප්‍රමාණය: හෙක්. 0.0130.

02. **කැබලි අංක 2**

ඉඩමේ නම: වරාමුල්ලඕවිට; හිමිකම් කියන අය: ආර්. ඒ. ටී. ඩබ්. එස්. රණවීර සහ තවත් අය; ප්‍රමාණය: හෙක්. 0.0142.

03. කැබලි අංක 3

ඉඩමේ නම: මහවලපල්ලවත්ත; හිමිකම් කියන අය: පී. ඒ. නන්දාවතී; ප්‍රමාණය: හෙක්. 0.0097.

04. කැබලි අංක 4

ඉඩමේ නම: මහවලපල්ලවත්ත; හිමිකම් කියන අය: පී. ඒ. නන්දාවතී; ප්‍රමාණය: හෙක්. 0.0163.

ඉහත සඳහන් ඉඩමට/පරවශ්‍යතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2015 ඔක්තෝබර් 22 වැනි දින පෙ. ව. 10.00 ට ගලිගමුව ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තව ද, 2015 ඔක්තෝබර් 15 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයන්, එකී ඉඩම/පරවශ්‍යතාවයට ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතු ය.

කේ. ජී. එස්. නිශාන්ත,
ප්‍රාදේශීය ලේකම්,
ගලිගමුව.

2015 සැප්තැම්බර් මස 18 වැනි දින,
ගලිගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

10-1120


1A - G 22490- 16 (2015/10)

මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.